## රෝගයෙන් ගොවිපල ආරක්ෂා කරගැනීම

- රෝගයෙන් ගොවිපල ආරක්ෂා කරගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය වන්නේ නිසි ජෛව ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමයි.
- ජෛව ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම මගින්
- රෝගය ආසාදනය නොවූ ගොවිපලට රෝගය ඇතුළුවීම වැළකෙන අතර ආසාදිත ගොවිපලවලින් රෝගය පිටතට ව්‍යාප්තවීම වැළකේ

## රෝග ව්‍යාප්තිය පාලනය (Control)

- ආසාධිත ගොවිපළවල සතුන් වහාම නිරෝධානය කිරීම සහ සතුන් ප්‍රවාහනය නැවැත් වීම.
- ආසාධිත සහ අවදානම් සහගතව ලගින් පිහිටි ගොවිපළවල ජීවී සතුන් සූකර මස් සහ අනෙකුත් ආසාධනය වීමේ හැකියාව සහිත ද්‍රව්‍ය පිටතට ගෙනයාම තහනම් කිරීම.
- ආසාධිත සහ ඔවුන් සමග අනුයාතව සිටි සතුන් මානුෂික ආකාරයෙන් විනාශ කිරීම
- පරිසරයට රෝග කාරක එකතුවීම අවම වන පරිදි ජල මූලාශ්‍රවලින් ඈත්ව සකසන ලද අළුහුණු අතුරන ලද ගැඹුරු වලවල් තුල සතුන් භූමදානය කිරීම.
- ඍජු (විලෝපිතයින් මගින්) හෝ වක්‍ර (ජලය,පස්, ඉවත්කරන යන්ත්‍ර ආදි) ආකාරවලින් තවදුරටත් රෝගය පැතිරීමේ අවදානම වැළැක්වීම.
- ආසාධිත සතුන් හා සත්ව කොටස් මුළුමනින්ම ගොවිපළ පරිශ්‍රයෙන් ඉවත් කිරීම
- 2% සෝඩියම්හයිඩ්‍රොක්සයිඩ් , phenol ,2% සෝඩියම්හයිඩ්‍රොක්ලෝරයිඩ් (බ්ලීච්ං) යොදා ගොවිපළ ක්‍රමවත් විෂබීජහරණය කිරීම.
- සූකර ගොවිපළ පශු වෛද්‍ය නිලධාරින් මගින් හෝ කණ්ඩායම් මගින් නිරන්තර සායනික පරීක්ෂාවකට ලක් කිරීම

- රෝග පාලනය සඳහා සතුන් හඳුනාගැනිමේ හැකියාව පවත්වා ගැනිම ඉතා වැදගත් වේ.

## සතුන් රහිත කාල පරිච්ඡේදය සහ නැවත සතුන් ඇතුළු කිරීම.

- ගොවිපළ ආසාධිත සතුන් ඉවත්කර ක්‍රමවත්ව විෂබිජහරණයකර අවම දින 40ක කාල පරිච්ඡේදයක් තැබිය යුතුය.
- නැවත ඌරන් ගොවිපලට ඇතුලත් කිරීමේදි සාමාන්‍ය සත්න්ගේ ප්‍රමාණයෙන් දල වශයෙන් 10% මුලිකව ඇතුලත්කල හැක.
- මෙම ඇතුලත්කරන සතුන්,රෝගය ආසාධිත නොවන ප්‍රදේශවල ගොවිපළවලින් ලබා ගත යුතු අතර නැවත ගොවිපළට ඇතුලත් කිරිමෙන් පසු සති 06ක කාලයක් කිසියම් රෝග ලක්ෂණ පෙන්නුම්කරයිද යන්න සමිපව නිරික්ෂණය කල යුතුය.
- එසේ රෝගි තත්වයන් නොපෙන්වන්නේ නම් සති 06ක කාලයකට පසුව ගොවිපලේ මුළු ධාරිතාවයට සතුන් ඇතුලත්කල හැක.
- නැවත සතුන් ඇතුලත්කල පසු ගොවිපළ දැඩි පරික්ෂාවක් යටතේ නිවැරදි ජෛව ආරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් පවත්වා ගෙනයා යුතු අතර ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය සමග මනා සන්නිවේදනය පවත්වා ගෙන යා යුතුය.


සත්ත්ව සෞඛ්‍ය අංශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ පේරාදෙණිය
දුරකථන අංක - 081 - 2388317


වැඩි විස්තර සඳහා

ඔබ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය හෝ

දිස්ත්‍රික් පශු විමර්ෂණ මධ්‍යස්ථානය අමතන්න



# African Swine Fever

# අප්‍රිකානු සූකර උණ රෝගය


සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ, පේරාදෙණිය

# අප්‍රිකානු සූකර උණ රෝගය

## හැඳින්වීම


අප්‍රිකානු සූකර උණ රෝගය (African Swine Fever) මේ දිනවල දකුණු හා පෙරදිග ආසියානු කලාපීය රටවල පැතිර යන, ඌරන්ට පමණක් වැළදෙන, ස්පර්ශය මඟින් බෝවන මාරාන්තික වෛරස් රෝගයකි.

ගෘහාශ්‍රිත ඌරන්ට මෙන්ම වනාශ්‍රිත ඌරන් අතර ද පහසුවෙන් පැතිරයා හැකි මෙම රෝගය හේතුවෙන් රෝගය වැළඳුණු සතුන් මියයාමට ඇති සම්භාවිතාවය ඉතා ඉහළ අගයක් ගන්නා අතර සූකර ගොවිපලක් ආශ්‍රිතව එක් සතෙකුට රෝගය වැළඳුණහොත් සමස්ත ගොවිපලටම වැළඳී සතුන් සියල්ලම මරණයට ගොදුරු විය හැක.

අප්‍රිකානු සූකර උණ රෝගය සතුන්ගෙන් මිනිසුන්ට බෝවීමක් සිදුනොවේ. නමුත් මෙය ඕනෑම වයස් කාණ්ඩයකට අයත් ඌරන් හට ආසාදනය වීමට ඇති හැකියාව නිසාම ගොවිපල හිමියාට ආර්ථික වශයෙන් දැඩි හානිදායක තත්ත්වයක් ඇති කරයි.


## රෝග ලක්ෂණ

- අධික උණ
- ආහාර අරුචිය
- වෙහෙසකරගතිය
- හුස්ම ගැනීමේ අපහසුතාවය
- සම නිල් පැහැවීම
- වමනය
- ලේ පාචනය
- සතුන් විශාල වශයෙන් මියයාම









## රෝගය ව්‍යාප්තිය විය හැකි ආකාර

- රෝග කාරක වෛරසය සහිත ආහාර, ජලය සහ ගොවිපල උපකරණ, රෝගී සතුන් ස්පර්ශයෙන් රෝගී සතුන් ප්‍රවාහනය කරනු ලබන රථ මඟින් රෝගය එක් ගොවිපලක සිට තවත් ගොවිපලකට ව්‍යාප්ත විය හැකිය.
- රෝගය හේතුවෙන් මිය ගිය සතුන් නිසි පරිදි බැහැර නොකිරීම නිසා පරිසරයට වෛරසය නිදහස්වීම හරහා ද රෝගය ව්‍යාප්ත විය හැක
- මිය ගිය රෝගී සතුන්ගේ සිරුරු නිසිපරිදි බැහැර නොකිරීම හේතුවෙන් රෝගය වනාන්තර ආශ්‍රිත ඌරන් හට පහසුවෙන්ම ව්‍යාප්ත විය හැක.
- ඌරන් සඳහා ආහාර ලෙස ඉඳුල් භාවිත කරන ගොවිපලවලට (ගුවන්තොටුපල / වරාය) නිසිපරිදි තම්බා සකස්කර නොගන්නා ඉඳුල් භාවිත කිරීමෙන් මෙම රෝගකාරකය ඇතුළු විය හැකිය.
- රෝගය ආසාදිත කිනිතුල්ලන් හරහා ද මෙම රෝගය ව්‍යාප්ත විය හැක.

අප්‍රිකානු සූකර උණ රෝගය සඳහා මේ වන තෙක් සාර්ථක එන්නතක් සොයාගෙන නොමැති නිසා, රෝගය ගොවිපලකට වැළඳුණහොත් ගොවිපල හිමියාට ආර්ථික වශයෙන් ඉතාමත් හානිදායකය. එබැවින් ජෛව ආරක්ෂණ ක්‍රම මඟින් රෝගය වළක්වා ගැනීම වඩාත්ම සුදුසුය.

